සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 08 - 2023

ගණිතය - I
Mathematics - I

කාලය පැය 02 යි
02 Hour

නම / විභාග අංකයඃ
Name/ Index No:

❖ ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

(1) රූපයේ දැක්වෙන රොම්බසයෙහි භ්‍රමණ කේන්ද්‍රය O ලෙස එහි ලකුණු කර එමගින් භ්‍රමක සමමිති ගණය සොයන්න.



(2) සාධාරණ පදය 3n වූ සංඛ්‍යා රටාවේ පහළොස්වැනි පදය සොයන්න.

(3) රූපයේ පරිමිතිය සොයන්න.



(4) සුළු කරන්න $5 - 1\frac{7}{8}$

(5) විසඳන්න $2x - 1 = 7$

(6) රූප සටහනේ දැක්වෙන තොරතුරු අනුව x හා y අගය සොයන්න.



(7) $1764 = 2 \times 2 \times 3 \times 3 \times 7 \times 7$ වේ. ඒ ඇසුරින් $\sqrt{1764}$ හි අගය සොයන්න.

(8) සාධක සොයන්න $15x - 24\,xy$

(9) මෝටර් රථයක් දළ ස්කන්ධය 1 t 350 *kg*, වේ. මෙවැනි මෝටර් රථ 15 ක ස්කන්ධය ටොන් හා *kg* වලින් දක්වන්න.

(10) $(-4)^3$ හි අගය සොයන්න.

(11) හිස් කොටුව සම්පූර්ණ කරන්න 5 : 2 = 20 : ☐

(12) (- 8) - (- 5) හි අගය සොයන්න.

(13) පහත සඳහන් රූප සටහන්වල "*a*" හා "*b*" මගින් දැක්වෙන කෝණ බද්ධ කෝණ යුගල වන රූපය තෝරන්න.



(i) (ii) (iii) (iv)

(14) රුපියල් 150 ක්ව තිබූ භාණ්ඩයක මිල 20% කින් ඉහළ ගියේ නම් එම භාණ්ඩයේ නව මිල සොයන්න.

(15) A = {" MIHINTHALAYA" වචනයේ අකුරු} නම් n (A) හි අගය සොයන්න.

(16) සුළු කරන්න $2(x-3) - 5(x+2)$

(17) රූපයෙහි දැක්වෙන තොරතුරු අනුව x හි අගය සොයන්න.



(18) අගය සොයන්න 5×7.06

(19) (- 8) කාල කලාපයෙහි පිහිටි ඇමරිකාව ලොස්ඇන්ජලීස් හි වේලාව ප.ව. 4.30 හා 2022.07.15 වනවිට (+ 1) කාල කලාපයෙහි පිහිටි ජර්මන්හි බොස් නගරයෙහි වේලාව හා දිනය සොයන්න.

(20) සමපාද ත්‍රිකෝණ සහිත මුහුණත් පමණක් ඇති ප්ලේටෝ කැට දෙකක් නම් කරන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 08 - 2023

Mathematics - II
ගණිතය - II

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. (පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ගණන 05 කි.)

(1) (*a*) අනුපාත සම්බන්ධව ඔබ පන්ති කාමරයේදී සිදුකරන ලද ක්‍රියාකාරකම ඇසුරින් ලබා ගත් දැනුම භාවිතයට ගනිමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විශ්ව රු. 5000/= ක මුදලක් මාස 12ක් ද අමල් රු. 8000/= මුදලක් මාස 6ක් ද ව්‍යාපාරයට යොදවන ලදී. වර්ෂය අවසානයේදී ව්‍යාපාරය ලැබූ ලාභය රු. 9000/= ක් වේ.

(i) දෙදෙනා අතර ලාභය බෙදා ගැනීමේදී යෙදූ මුදල පමණක් යොදා ගැනීම ප්‍රමාණවත් ද? හේතු දක්වන්න.

(ලකුණු 03)

(ii) එසේ නම් දෙදෙනා අතර ලාභය බෙදිය යුතු අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න.

(ලකුණු 05)

(iii) ඒ අනුව දෙදෙනාට ලැබෙන මුදල වෙන වෙනම සොයන්න.

(ලකුණු 04)

(*b*) රසකැවිලි වර්ගයක් සෑදීම සඳහා පිටි සහ හකුරු 3 : 2 අනුපාතයෙන්ද පිටි හා කජු 6 : 1 අනුපාතයෙන්ද මිශ්‍ර කරයි. එම රසකැවිල්ලේ තිබූ පිටි, හකුරු සහ කජුවල අනුපාතය සොයන්න.

(ලකුණු 04)

(2) (*a*) සුළු කරන්න.

(i) $2\frac{1}{5} \times 1\frac{3}{4}$ (ලකුණු 03)

(ii) $5\frac{3}{4} \times 3\frac{1}{2}$ (ලකුණු 03)

(*b*) එක්තරා රූපවාහිනී වැඩ සටහන් මාලාවක් සඳහා පැය $8\frac{1}{4}$ ක් වෙන් කර තිබුණි. එක වැඩ සටහනක් පැය $1\frac{1}{4}$ ක සීමා කලේ නම්,

(i) පැවැත්විය හැකි වැඩ සටහන් ගණන කොපමණද? (ලකුණු 03)

(ii) ඉතිරිවන කාලය මිනිත්තු කොපමණද? (ලකුණු 02)

(3) (*a*) රූපයේ තොරතුරු භාවිතයෙන් x හි අගය සොයන්න. (ලකුණු 05)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

(*b*) (i) $X\hat{P}Q$ ට සමාන කෝණය නම් කර හේතු දක්වන්න. (ලකුණු 02)



(ii) $X\hat{P}Q$ ට පරිපූරක බද්ධ කෝණයක් නම් කර හේතු දක්වන්න. (ලකුණු 02)

(iii) x හා y අගයන් සොයන්න. (ලකුණු 02)

(4) දී ඇති රූපය අනුව,



(i) A කුලකය අවයව සහිතව ලියන්න. (ලකුණු 02)

(ii) *n* (A) අගය කීයද? (ලකුණු 02)

(iii) B කුලකය විස්තර කරන්න. (ලකුණු 02)

(iv) සර්වත්‍ර කුලකය අවයව සහිතව ලියන්න. (ලකුණු 02)

(v) 4, B කුලකයේ අවයවයක් වේ යන්න සංකේත මගින් දක්වන්න. (ලකුණු 03)

(5) (*a*) විසඳන්න.

(i) $5x + 1 = 21$ (ලකුණු 03)

(ii) $\frac{3(7 - 2x)}{2} = 9$ (ලකුණු 05)

(*b*) සාධක සොයන්න.

$2x^2y - 6xy^2 + 12xy$ (ලකුණු 03)

(6) (*a*) අගය සොයන්න.

(i) 4.5×3.6

(ii) 0.02×0.024

(iii) $18 \div 0.36$ (ලකුණු 06)

(*b*) (i) 0.07 භාගයක් ලෙස ලියන්න. (ලකුණු 02)

(ii) කිරි ලීටර් 14 ක්, ප්‍රමාණය ලීටර් 1.25 ක ධාරිතාව ඇති බෝතල්වලට පිරවූ විට ලබා ගත හැකි උපරිම බෝතල් ගණන කොපමණද? ඉතිරිවන කිරි ප්‍රමාණය කොපමණද? (ලකුණු 03)

(7) ABCD සෘජුකෝණාස්‍රයේ AD හි මධ්‍ය ලක්ෂය E වේ.



(i) AE දිග සොයන්න. (ලකුණු 02)

(ii) AEC ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 04)

(iii) AECB චතුරස්‍රයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 05)

PAST PAPERS WIKI
(4) www.PastPapers.WiKi (4)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 08 - 2023

ගණිතය - පිළිතුරු

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරු	ලකුණු
1.	 අක්ෂ ඇඳ O ගැනීම සමමිති ගනය 2	1 1
2.	3×5 45	1 1
3.	$6 \times 2 = 12$ $5 \times 2 = 10$ $2 \times 2 = 4$ } ලෙස ගැනීම $\underline{\underline{26\text{ cm}}}$	1 1
4.	$4 - \frac{7}{8}$ $3\frac{1}{8}$	1 1
5.	$2x = 8$ $x = 4$	1 1
6.	$y = 50^0$ $x = 50^0$	1 1
7.	$2 \times 3 \times 7$ 42	1 1
8.	$3x\,(5 - 8y)$	2
9.	t kg 1 350 × 15 20 250	2
10.	-64	2
11.	$\frac{20}{5} - 4$ $2 \times 4 = 8$	1 1
12.	$-8 + (+5)$ -3	1
13.	(iii) රූපය	1
14.	$150 \times \frac{120}{100} = 180$	2

ප්‍රශ්න අංකය	පිළිතුරු	ලකුණු
15.	$A = \{M, I, A, H, N, T, L, Y\}$ $n(A) = 8$	1 1
16.	$2x - 6 - 5x - 2$ $-3x - 8$	1 1
17.	$5x = 4 \times 3$ $x = \frac{12}{5} = 2.4$	1 1
18.	706 × 5 3530 35.30	1 1
19.	16 . 30 9 . 00 25 . 30 2022.07.16 දින පෙ.ව. 1.30	1 1
20.	සවිධි චතුස්තලය සවිධි අෂ්ඨ තලය	1 1

II කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරු	ලකුණු
1.	(a). (i). නැත. යොදවන කාලය වෙනස් බැවින්.	3
	(ii). විශ්ව : අමල්	
	$5000 \times 12 : 8000 \times 6$	2
	$5 \times 2 : 8 \times 1$	2
	$5 : 4$	1
	(iii). $\frac{9000}{9} = 1000$	2
	විශ්ව $= 1000 \times 5$	
	= රු. 5000/=	1
	අමල් $= 1000 \times 4$	
	= රු. 4000/=	1
	(b). කජු පිටි හකුරු	
	3 : 2	
	1 : 6	2
	1 : 6 : 4	2

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

II කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරු	ලකුණු
2.	(a). (i). $\frac{11}{5} \times \frac{7}{4}$	1
	$\frac{77}{20}$	1
	$3\frac{17}{20}$	1
	(ii). $\frac{23}{4} \div \frac{7}{2}$	
	$\frac{23}{4} \times \frac{2}{7}$	1
	$\frac{23}{14}$	1
	$1\frac{9}{14}$	1
	(b). (i). $8\frac{1}{4} \div 1\frac{1}{4}$	1
	$\left.\begin{array}{l}\frac{33}{4} \div \frac{5}{4} \\ \frac{33}{4} \times \frac{4}{5}\end{array}\right\}$	1
	$\frac{33}{5} = 6\frac{3}{5}$	
	∴ වැඩසටහන් ගණන = 6	1
	(ii). ඉතිරි පැය $\frac{3}{5}$	1
	මිනිත්තු $60 \times \frac{3}{5}$	
	මිනිත්තු 36	1
		11
3.	(a). $180^0 - 115^0$	
	65^0	2
	$x = 18^0 - 150^0$	
	$x = 30^0$	2
	(b). (i). $R\hat{P}Y$ ප්‍රතිමුඛ	2
	(ii). $X\hat{P}R$ සරල රේඛාවක් මත	2
	(iii). $x = 100^0$	1
	$y = 20^0$	2
		11
4.	(i). A = {2, 3, 5, 7}	2
	(ii). n (A) = 4	2
	(iii). B = {1 සිට 10 දක්වා පූර්ණවර්ග සංඛ්‍යාව}	2
	(iv). ε = {1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10}	2
	(v). $A \in \varepsilon$	3
5.	(a). (i). $5x + 1 - 1 = 21 - 1$	1
	$\frac{5x}{5} = \frac{20}{5}$, x = 4	2

ප්‍රශ්න අංකය	පිළිතුරු	ලකුණු
	(ii). $2 \times \frac{3(7-2x)}{2} = 9 \times 2$	1
	$\frac{3(7-2x)}{3} = \frac{18}{3}$	1
	$7 - 2x - 7 = 6 - 7$	1
	$\frac{2x}{-2} = \frac{-1}{-2}$	1
	$x = \frac{1}{2}$	1
	(b). $2xy\,(x - 3y + 6)$	3
		11
6.	(a). (i). 45×36 ; 270 ; 135 ; 1620 ; 16.20	2
	(ii). 24×2 ; 48 ; 0.00048	2
	(iii). $\frac{18 \times 100}{0.36 \times 100} = \frac{1800}{36}$	
	$1800 \div 36$: 50 (1800, 180, 0) = 50	2
	(b). (i). $\frac{7}{100}$	2
	(ii). $\left.\begin{array}{l}\frac{14 \times 100}{1.25 \times 100} \\ \frac{1400}{125}\end{array}\right\}$	1
	$1400 \div 125$: 11 (1400, 125, 150, 125, 25) ; බෝතල් 11	1
	ඉතිරි 0.25 l	
	250 ml	1
		11
7.	(i). AE = 4cm	2
	(ii). $\frac{1}{2} \times 4 \times 18$	2
	$36cm^2$	2
	(iii). $\frac{1}{\not{2}} \times \not{8}^{4} \times 18$	
	$72cm^2$	2
	72 +36	2
	$108cm^2$	1
		11

(2) WWW.PastPapers.WiKi (2)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

LOL.lk
BookStore

විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න